**ගිරිබාව ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 14 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 17 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගිරිබාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා කාර්යාල ඉඩම ඇතුළුව පොදු ඉඩම් කොටස් 30 ක් සහ සුසාන භූමි 14ක් වශයෙන් වූ ඉඩම් 48 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගනිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිලධාරින් 05 දෙනෙකුගෙන් අය විය යුතු සේවක ණය රු.580,520 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි | නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගනිමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාලවිගණන ගාස්තු සඳහා වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 දෙසැම්බර් මාසයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු රු.2,366,148 ක වැටුප් ප්‍රතිපූර්ණ මුදල ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කළ යුතුවේ. | විගණනය මගින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ රු.305,764 ක පැහැදිලි නොකළ ගිණුම් මාරු ශේෂයක් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය මගින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට විෂයයන් 16 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා අදාළ ලේඛන/උපලේඛනශේෂයන් අතර රු.5,764,313 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කරමි. |
| (උ) | අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.12,478,366 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි ලේඛන ඉදිරිපත් කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,168,824 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.326,824 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. වරිපනම් හා බදු | 515,000 | 589,800 | 589800 | - | 415,000 | 457,260 | 457,260 | - |
| II. බදු කුලී | 3,248,000 | 3,066,360 | 3,106,510 | 151,316 | 2,710,400 | 3,049,865 | 3,049,865 | 220,603 |
| III. බලපත්‍ර ගාස්තු | 420,000 | 408,275 | 408,275 | - | 415,000 | 397,150 | 397,150 | - |
| IV. වෙනත් ආදායම් | 39,041,322 | 4,014,435 | 8,138,460 | 234,560 | 37,390,004 | 33306111 | 7,244,780 | 4,358,586 |
| එකතුව | 43,224,322 | 8,078,870 | 12,243,045 | 385,876 | 40,930,404 | 37,210,386 | 11,149,055 | 4,579,189 |

සටහන - 2019 වර්ෂය තුලදී රැස්කල ආදායමින් රු. 3,970,617 ක් පෙර වර්ෂ වල හිඟ ආදායම් වේ.

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දියුණු කළ ප්‍රදේශ ඇතුලත පිහිටියා වූ යම් නිශ්චල දේපලක හෝ දේපල වර්ගයක වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | දියුණු නාගරික ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් කලාපයක් ලෙස නම් කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. ඉදිරියේදී වරිපනම් කලාප ඇති කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි. |

**2.2.3 කුලී**

---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පැරකුම්පුර කඩ කාමර 05 ක් සඳහා රු.1,650 ක තක්සේරු කුලියකඩහිමියන්ගේ විරෝධයට අනුව නැවත රු.1,250 කට තක්සේරු කර තිබුණි. එහෙත්2019 මාර්තු 19 දින සිදු කළ භෞතික පරික්ෂාවේදී එක් කඩ කාමරයක් රු.4,000 ක මාසික කුලියට වෙනත් පුද්ගලයෙකුට ලබා දී ඇති නමුත් සභාවට කුලී මුදල් වැඩි කර අයකිරීමට නොහැකි වී තිබුණි. | ගිවිසුම් ගත කොන්දේසි කඩ කිරීමට එරෙහිව ගිවිසුම් ප්‍රකාරව ක්‍රියා කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 කාර්යය සාධනය**

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අයවැයගත කර්මාන්ත ඉටු නොකිරීම**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත කර තිබුණ රු.16,700,000 ක් වූ කර්මාන්ත 14 ක් ඉටු කර නොතිබුණි. | අයවැයගත කර්මාන්ත ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. |

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත නොකළ කර්මාන්ත 09 ක් සඳහා රු.363,647ක් වැය දරා තිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ ඝනඅපද්‍රව්‍ය කළමණාකරණය සඳහා රජයෙන් වෙන් කර තිබූ අක්කර 05ක භූමියේ සංවර්ධන කටයුතු සඳහා 2015 හා 2016 වර්ෂවලදී රු.500,000 ක මුදලක් වැයකර තිබුණ නමුත් ඝන අපද්‍රව්‍ය කළමණාකරණයක් සිදුකරනොතිබූ අතරබලප්‍රදේශයේ පදිංචිකරුවන් නොදිරන කසළ බැහැරකිරීමේ ක්‍රමවේදය පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සක්‍රීය කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි.2020 වර්ෂයේ දී නොදිරන කසළ ගබඩා කර තබා ගැනීමට ගොඩනැගිල්ලක් සකසා නොදිරන කසළ එකතු කිරීමට ඉදිරියේදී කටයුතු සිදුකරමි. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂවල වටිනාකමින් වර්ෂ 01ත්03 ත් අතර වූ රු.604,111 ක් සහ වර්ෂ 03 ට වැඩි රු.101,500 ක් වශයෙන් වූ හිඟ මුදල් 2020 ජූලි 10 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළි ගෙන ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 31දිනට ගෙවිය යුතු ශේෂ වටිනාකමින් වර්ෂ 01-03 ත් අතර වූ රු.788,282 ක් 2020 ජූලි 10 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තෘතීක,ද්විතීක, ප්‍රාථමික හා අනියම්/ කොන්ත්‍රාත් සේවාවන්ට අදාළව පුරප්පාඩු 15ක් පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගනිමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.1,200,000ක් වූ ඩබල් කැබ් රථය,සුසාන භූමි 25 ක් හා ඉඩම් 12ක්සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. |

**3.4.2 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුට්ටිගල් ව්‍යාපෘතියට අදාළ රු.590,401 ක් වැයකළ ඉදිකිරීම් හාරු.260,000 ක්වටිනා කුට්ටි ගල් නිෂ්පාදන යන්ත්‍ර 02ක් 2015 වර්ෂයේ සිටම නිශ්කාර්යව පැවතිය දී2019 අගොස්තු මාසයේ දී බිංගිරිය ප්‍රාදේශීය සභාවෙන් පරිත්‍යාග ලෙස තවත් කුට්ටි ගල් නිෂ්පාදන යන්ත්‍ර 02ක් ලැබී තිබුණි. | කුට්ටි ගල් ව්‍යාපෘතිය සක්‍රීයව පවත්වා ගෙනයාමට කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු ගාබේජ් ටේලරය නිශ්කාර්යව පැවතුණි. | කසල එකතු කිරීමේ කටයුතු සක්‍රීය කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි. |
| (ඇ) | සභාව සතු රු.608,000 ක් වටිනා ට්‍රැක්ටරයක් හා රු.336,300 ක් වටිනා යකඩ ජල බවුසරය අවුරුදු 05 කට අධික කාලයක් තිස්සේ අක්‍රීයව පැවතුණි. | යාන්ත්‍රික ඉංජිනේරු උපදෙස් මත අළුත්වැඩියා කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනයේ පෙන්වා දී ඇති අඩු පාඩු පිළිගනිමි.ඉදිරියේදී යාන්ත්‍රික ඉංජිනේරු උපදෙස් අනුව කටයුතු කරමි. |